# ආර්ථික හා සමාජ පිරිවැය

**බලශක්තිය**

1987 වර්ෂයේ වැඩි කාලයක් තුළ පැවැති නියඟය, බලශක්ති අංශය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කළේය. ජලාශ්‍රිත ප්‍රදේශවල පැවැති අඩු වර්ෂාපතනය හේතුකොටගෙන විදුලිබල උත්පාදනය දැඩි ලෙස සීමා කිරීමට සිදු විය. මේ නිසා විදුලිය බලය සඳහා වූ ඉල්ලුම සපුරාලීම පිණිස ඩීසල් හා දැවි තෙල් බහුල වශයෙන් යොදා විදුලිය උත්පාදනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් විය. මේ අතර, රටේ ආරක්ෂක කටයුතුද දැඩි කිරීම නිසා ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදිතවල පරිභෝජනය ඉහළ නැංගේය. ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා පැවැති අධික ඉල්ලුම හේතුකොටගෙන ඛනිජ තෙල් අවශ්‍යතාවයේ වැඩි වීමක් ඇති විය. එය ආනයනය කළ තෙල් හා සම්බන්ධ වියදම සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කරලීමෙහි ලා හේතු විය.

දර, කෘෂිකාර්මික අපද්‍රව්‍ය හා වෙනත් ශාක අපද්‍රව්‍ය ආදියෙන් සමන්විත වූ වාණිජ නොවන බලශක්ති මූලාශ්‍රවල ප්‍රමාණය 1987 වර්ෂයේදී දළ වශයෙන් ඛනිජ තෙල් ටොන් සමක දශ ලක්ෂ 4.43 ක් වී යැයි ගණන් බලා ඇත. මෙය 1987 වර්ෂයේ මුළු බලශක්ති සැපයුමෙන් දළ වශයෙන් සියයට 70 ක් පමණ වේ. ඉතිරි ප්‍රමාණය ඛනිජ තෙල්, විදුලිය බලය, ද්‍රව ඛනිජ වායුව සහ ගල් අඟුරු වලින් ද යුක්ත වේ.

අත්හද බැලීමේ පදනමක් යටතේ ක්‍රියාත්මක කරන ලද රන්දෙණිගල ජල විදුලියබල ව්‍යාපෘතිය (මෙගවොට් 61 බැගින් වූ ඒකක 2 ක්) සමඟ ස්ථාපිත විදුලියබල ධාරිතාවය 1987 වර්ෂය අවසාන වන විට මෙ. වො. 868.25 දක්වා වැඩි විය. පසුගිය වසර අවසානයේ ධාරිතාවය මෙ. වො. 746.25 ක් විය. 1986 දී වසා දමන ලද මෙ. වො. 6 ක ධාරිතාවයක් ඇති පිටකොටුවේ ඩීසල් බලාගාරය 1987 ජූනි මාසයේදී නැවත විවෘත කරන ලදී. මේ හේතුවෙන් මෙ. වො. 270 ක් වූ තාප බල උත්පාදනයද ඇතුළුව විදුලිය බල උත්පාදනයේ මුළු ධාරිතාවය 1987 වර්ෂය අවසානයේ මෙ. වො. 1138. 25 ක් දක්වා වැඩි විය. එහෙත් නඩත්තු කටයුතු සඳහා කොත්මලේ ජල විදුලිය බල ව්‍යාපෘතියේ එක් ටර්බයිනයක් (මෙ. වො. 67) සහ කැළණිතිස්ස තාප බලාගාරයේ (මෙ. වො. 50) වූ තවත් ටර්බයිනයක්ද විමසුමට ලක්වන වර්ෂය තුළදී ක්‍රියාත්මක නොවීය.

1987 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු විදුලිය බල උත්පාදනය කි. වො. පැය දශ ලක්ෂ 2,707.6 ක් වූ අතර එය 1986 වර්ෂයේ වූ මුළු උත්පාදනය වන කි. වො. පැය දශ ලක්ෂ 2,651.8 ට වඩා සියයට 2 ක වැඩි වීමක් පෙන්වීය. ජල විදුලියබල උත්පාදන යන්ත්‍ර උපරිම ධාරිතාවයකින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ජල මට්ටමක් ජලාශවල නොතිබීම නිසා තාපබල උත්පාදනය උපයෝගී කර ගනිමින් විදුලිය බල හිඟය පියවා ගැනීමට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1986 වර්ෂයේදී සියයට 99.7 ක්ව පැවති ජල විදුලියබල ප්‍රමාණයේ සාපේක්ෂ කොටස 1987 දී සියයට 80.4 දක්වා අඩු විය. තාපබල උත්පාදනය හේතුකොටගෙන බැර ඩීසල්, මණ්ඩි තෙල් සහ දැවි තෙල් වැඩි වශයෙන් පරිභෝජනය කරන්නට සිදු වූ අතර 1986 දී වූ මෙට්‍රික් ටොන් 1,618 හා සසඳන විට 1987 දී මුළු පරිභෝජනය මෙ. ටො. 157,463 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තාප බල උත්පාදනය සඳහා ලං. වි. ම. විසින් භාවිතා කරන ලද ඉන්ධනවල පිරිවැය 1986 දී රුපියල් දශ ලක්ෂ 11.6 ක්ද, 1987 දී රුපියල් දශ ලක්ෂ 1,165.6 ක්ද විය. තාපබල උත්පාදනයේදී දැරීමට සිදු වූ අතිරේක පිරිවැය පියවා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් 1987 මැයි මස 1 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි විදුලිය පරිභෝජනය ඒකක 150 ක් ඉක්මවන අවස්ථාවලදී සියයට 15 ක ඉන්ධන ගැලපීමේ ගාස්තුවක් පනවනු ලැබීය. 1987 සැප්තැම්බර් මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙය සියයට 30 දක්වා වැඩි කරන ලදී. නියඟය සහ තාපබල උත්පාදනයෙහි අධික පිරිවැය නිසා විදුලිය බලය සැපයීමේදී මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා හේතුකොටගෙන 1987 අගෝස්තු 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දිවයින පුරා දිනකට පැය 3 1/2 ක විදුලිය බලය කපා හැරීමක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබීය. එහෙත් 1987 ඔක්තෝබර් මාසයේ සිට ජලාශ්‍රිත ප්‍රදේශවල ජල මට්ටම ඉහළ නැඟීම නිසා මෙලෙස විදුලිය බලය කපා හැරීම ඉවත් කර ගන්නා ලදී.

## 1 . 20 සංඛ්‍යා සටහන

## බලශක්ති අංශයේ මූලික ලක්ෂණ
## 1986 – 1987

| ශීර්ෂය | ඒකක | 1986 | 1985 ට වඩා ප්‍රතිශත වෙනස | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛණිජ තෙල් නිෂ්පාදන | | | | | |
| 1·1 අපනයන .. | රු. ද. ල. | 2,358·0 | – 39·2 | 2,592·2 | 9.9 |
| එම .. | විගැහි ද. ල. | 71·7 | – 48·9 | 68·0 | – 5.2 |
| 1·2 ආනයන .. | රු. ද. ල. | 6,293·1 | – 42·7 | 8,715·8 | 38.5 |
| එම .. | විගැහි ද. ල. | 191·3 | – 51·9 | 228·8 | 19·6 |
| 1·3 ආනයනය කළ ප්‍රමාණය | | | | | |
| 1·3·1 බොර තෙල් .. | මෙ. ටො. | 1,638,547 | – 1·1 | 1,778,853 | 8·5 |
| 1·3·2 පිරිපහදු නිෂ්පාදන .. | මෙ. ටො. | 147,445 | – 18·9 | 254,636 | 72·7 |
| 1·3·3 අනෙකුත් නිෂ්පාදන | මෙ. ටො. | 24,845 | 19·6 | 25,738 | 3·6 |
| 1·4 බොර තෙල් බැරලයක සාමාන්‍ය මිළ .. | රුපියල් | 454·26 | – 41·4 | 543·29 | 19·6 |
| එම .. | එ. ජ. ඩොලර් | 16·26 | – 42·7 | 18·45 | 13·5 |
| 1·5 දේශීය අලෙවිය | | | | | |
| 1·5·1 පෙට්‍රල් .. | මෙ. ටො. | 130,624 | 7·4 | 140,402 | 7·5 |
| 1·5·2 සුදු ඩීසල් .. | ,, | 488,907 | 0·1 | 497,303 | 1·7 |
| 1·5·3 බැර ඩීසල් .. | ,, | 20,126 | – 14·6 | 131,802 | ** |
| 1·5·4 සුපිරි ඩීසල් .. | ,, | 15,871 | 17·1 | 20,558 | 29·5 |
| 1·5·5 භූමි තෙල් .. | ,, | 154,182 | 0·3 | 155,575 | 0.9 |
| 1·5·6 දැවි තෙල් .. | ,, | 129,753 | – 9·2 | 161,668 | 24.9 |
| 1·6 ලීටරයක දේශීය මිළ .. | | | | | |
| 1·6·1 පෙට්‍රල් .. | රුපියල් | 13·50 | — | 13·50 | — |
| 1·6·2 සුදු ඩීසල් .. | ,, | 8·13 | — | 8·13 | — |
| 1·6·3 බැර ඩීසල් .. | ,, | 7·83 | — | 7·83 | — |
| 1·6·4 සුපිරි ඩීසල් .. | ,, | 9·28 | — | 9·28 | — |
| 1·6·5 භූමි තෙල් .. | ,, | 6·58 | — | 6·58 | — |
| 1·6·6 දැවි තෙල් .. | ,, | | | | |
| 500 .. | ,, | 4·22 | 19·1 | 4·22 | — |
| 800 .. | ,, | 3·87 | 20·5 | 3·87 | — |
| 1000 .. | ,, | 3·72 | 21·2 | 3·72 | — |
| 1·6·7 තාර .. | ,, | 7·22 | — | 7·22 | — |
| 2. විදුලිය බලය | | | | | |
| 2·1 ස්ථාපිත ධාරිතාවය .. | මෙගවොට් | 1,010·25 | – 0·6 | 1,138·25 | 12·7 |
| 2·1·1 ජල බලය .. | ,, | 746·25 | — | 868·25 | 16·3 |
| 2·1·2 තාප බලය .. | ,, | 264·00 | – 2·2 | 270·00 | 2·3 |
| 2·2 ජනනය කළ ඒකක .. | කි. වො. පැ. ද. ල. | 2,651·8 | 7·6 | 2,707·6 | 2·1 |
| 2·2·1 ජල බලය .. | ,, | 2,645·3 | 10·5 | 2,177·5 | – 17·7 |
| 2·2·2 තාප බලය .. | ,, | 6·5 | – 90·6 | 530·1 | *** |
| 2·3 මුළු අලෙවිය .. | ,, | 2,232·3 | 8·3 | 2,249·0* | 0·7 |
| 2·3·1 ගෘහස්ථ .. | ,, | 369·2 | 6·6 | 384·0* | 4·0 |
| 2·3·2 කාර්මික .. | ,, | 925·3 | 8·8 | 879·0* | – 5·0 |
| 2·3·3 වාණිජ .. | ,, | 381·4 | 9·0 | 399·0* | 4·6 |
| 2·3·4 පළාත් පාලන ආයතන | ,, | 543·3 | 8·2 | 573·0* | 5·5 |
| 2·3·5 වීථි ආලෝක කිරීම | ,, | 13·1 | 11·0 | 14·0* | 6·9 |

මූලයන් : ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව;
ලංකා විදුලි බල මණ්ඩලය.

* තාවකාලික

** පෙර වර්ෂයට වඩා 6 ගුණයකින් වැඩිය.

*** පෙර වර්ෂයට වඩා 82 ගුණයකින් වැඩිය.

1986 දී කි. වො. පැය දශ ලක්ෂ 2,232.3 ක් වූ මුළු විදුලිය බල අලෙවිය 1987 දී කි. වො. පැය දශ ලක්ෂ 2,249 ක් දක්වා සියයට 0.7 කින් වැඩි විය. මෙම වර්ධන අනුපාතිකය 1978–1986 කාලච්ඡේදය තුළ වාර්තා වූ සියයට 9 ක වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතිකයට වඩා සැළකිය යුතු ලෙස අඩු වීමකි. විදුලිය බල අලෙවියෙහි පහත් වර්ධනයක් ඇති වූයේ ප්‍රධාන වශයෙන්ම අභ්‍යන්තරික නොසන්සුන්තා හේතුකොටගෙන විදුලිය බලය කපා හැරීම සහ බල සැපයුමෙහි ඇණ හිටීම් සිදු වීමත් නිසාය. කෙසේ වුවද, කර්මාන්ත අංශය හැර අනෙකුත් සියළුම අංශවල විදුලිය බල පරිභෝජනයේ වැඩිවීම් 1987 වර්ෂය තුළ වාර්තා විය. ඉකුත් වර්ෂය හා සැසැඳීමේදී, විදුලිය බලය කපා හැරීම නිසා කර්මාන්ත අංශය තුළ විදුලිය පරිභෝජනයෙහි සියයට 5 ක අඩු වීමක් වාර්තා වී ඇත. කි. වො. පැය දශ ලක්ෂ 879 ක් වූ කර්මාන්ත අංශයේ විදුලිය බල පරිභෝජනය වර්ෂයේ මුළු විදුලිය අලෙවියෙන් සියයට 39 ක් විය. 1987 වර්ෂයේදී පළාත් පාලන ආයතන විසින් විදුලිය මිළදී ගැනීම් කි. වො. පැය දශ ලක්ෂ 573 ක් වූ අතර එය මුළු විදුලිය බල පරිභෝජනයෙන් සියයට 25 ක් විය. ගෘහස්ථ සහ වාණිජ අංශ මුළු විදුලිය පරිභෝජනයෙන් පිළිවෙලින් සියයට 17 ක් සහ සියයට 18 ක් බැගින් පරිභෝජනය කළ අතර ඉතිරි ප්‍රමාණය වීදි ආලෝක කිරීම හා වෙනත් අරමුණු සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි බොර තෙල් මිළ ගණන් ඉහළ යෑමේ උපනතියක් පැවැතීමත් ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ඉල්ලුම වැඩි වීමත් යන කරුණු හේතුකොටගෙන 1987 වර්ෂයේ ඛනිජ තෙල් ආනයනය සඳහා වැය වූ විදේශ විනිමය ප්‍රමාණය ඉකුත් වර්ෂයේ පැවැති ප්‍රමාණයට වඩා සැළකිය යුතු ලෙස වැඩි විය. 1986 දී මුළු ආනයන වලින් සියයට 11 ක්වූ ඛනිජ තෙල් වියදම 1987 දී සියයට 14 දක්වා වැඩි විය. රුපියල් දශ ලක්ෂ 6,293 (විගැහි දශ ලක්ෂ 191) ක් වූ 1986 වර්ෂයේ ඛනිජ තෙල් ආනයන වියදම 1987 දී රුපියල් දශ ලක්ෂ 8,716 (විගැහි දශ ලක්ෂ 229) ක් දක්වා රුපියල් වටිනාකම අනුව සියයට 39 කින් (විගැහි වටිනාකම අනුව සියයට 20 කින්) වැඩි විය. අයි ගාස්තු අය කිරීම් හැරුණුවිට, විදුලිය බලය සහ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පැවැති දේශීය ගාස්තු ක්‍රමය 1987 වර්ෂය පුරාම නොවෙනස්ව පැවතුණි. 1984 වර්ෂයේ සිට දක්නට ලැබුන පහල බසින උපනතියට වෙනස්ව, 1987 දී දේශීය වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම වැඩි විය. ඉල්ලුමේ වර්ධනයට හේතු වූ වැදගත්ම සාධකය වූයේ තාපබල උත්පාදනය සඳහා යොදා ගත් බැර ඩීසල් සහ දැවි තෙල් භාවිතය වැඩි වීමය. කෙසේවුවද, ඉකුත් වර්ෂවලදී මෙන්ම කර්මාන්ත අංශයේ බැර ඩීසල් සඳහා වූ ඉල්ලුම 1986 වර්ෂයේදී වූ මෙ. ටො. 19,823 සිට 1987 දී වූ මෙ. ටො. 18,649 දක්වා සියයට 6 කින් අඩු විය.

විදුලිය බලය කපා හැරීමෙන් ඇති වූ විදුලිය බල හිඟයට මුහුණ පෑම සඳහා විකල්ප වැඩපිළිවෙලක් කර්මාන්ත අංශය විසින් යොදා ගැනීම නිසා දැවි තෙල් පරිභෝජනය කිරීම 1986 වර්ෂයට වඩා සියයට 25 කින් වැඩි විය. අඩු වියදම් සලකා බැර ඩීසල් වෙනුවට දැවි තෙල් ආදේශ කිරීමක්ද දක්නට ලැබුණි. ආරක්ෂක කටයුතු දැඩි කිරීම විශාල වශයෙන් සිදු වීම හේතුකොට ගෙන සුදු ඩීසල් සහ පැට්‍රල් සඳහා ඉල්ලුම පිළිවෙලින් සියයට 8 කින් සහ සියයට 2 කින් වැඩි විය. මේ අතර, 1987 වර්ෂයේදී භූමි තෙල් සඳහා වූ ඉල්ලුමද සුළු වශයෙන් වැඩි විය.

**ගමනාගමනය**

දිවයිනේ ඇතැම් ප්‍රදේශවල පැවැති අවිනිශ්චිත වාතාවරණය හේතුකොට ගෙන ගමනාගමන කටයුතු තියුණු පීඩනයකට ලක්වුවද මගී කිලෝ මීටර් ප්‍රමාණය අනුව බලනවිට වර්ෂය තුළදී ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල (ශ්‍රී. ලං. ප්‍රා. ග. ම.) විසින් සපයන ලද මගී සේවාවල සුළු වර්ධනයක් ඇති විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී. ලං. දු. සේ.) සහ පෞද්ගලික අංශය විසින් සපයන ලද මගී ප්‍රවාහන සේවයෙහි පසුබෑස්මක් වාර්තා විය. විශාල වශයෙන්ම රථවාහන ආනයනය කිරීමේ වියදම අධික වීම නිසා පෞද්ගලික අංශයට සිය බස් රථ ඇණිය වැඩිකර ගැනීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 වර්ෂයේදී මගී කිලෝ මීටර් ප්‍රමාණය අනුව බලන කල මගී ප්‍රවාහන අංශයෙහි පෞද්ගලික අංශය සතු දායකත්වය සුළු වශයෙන් පහත වැටුණි.

1986 වර්ෂය අවසාන භාගයේදී අර්ධ සුඛෝපභෝගී බස් රථ 150 ක් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල දියුණු මඟී සේවාවක් සැපයීමට සහ පැටවුම් සාධකය වැඩිකර ගැනීමට තරම් සාපේක්ෂ වශයෙන් යහපත් තත්ත්වයක පැවතුණේය. අඩු ධාරිතාවයක් ඇති වහළ මිටි, පෞද්ගලික බස් රථවලින් මගීන් ප්‍රවාහනය කිරීම තහනම් කිරීම හේතුවෙන් මගී ගමනාගමනයෙහිලා ශ්‍රී ලං. ප්‍රා. ග. ම. බස්රථවලට විශාල අනුග්‍රහයක් ලැබිණි. ආර්ථිකමය වශයෙන් අවාසිදායක වූ බස් ධාවන කිලෝ මීටර් ප්‍රමාණයක් කපා හැරීමෙන් හා ඉල්ලුම් රටාවේ වෙනස්වීම අනුව සේවා විමර්ශනය කිරීමෙන් අනතුරුව ශ්‍රී. ලං. ප්‍රා. ග. ම. විසින් සිය නියමිත සේවා ප්‍රතිශෝධනය කරන ලදී.

ශ්‍රී. ලං. ග. ම. යෙහි සාමූහික අරමුණ වූයේ 1987 වර්ෂය තුළ මඟී සේවා පුළුල් කිරීමට වඩා පවතින මගී සේවා වඩාත් කාර්යක්ෂමව සහ විශ්වාසය තහවුරුවන ලෙස ශක්තිමත්කර පවත්වාගෙන යෑමය. සමස්ත මූල්‍ය හැඩගැස්ම වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී. ලං. ග. ම. යට අයත් ඒකක කිහිපයකටම (ඉංජිනේරු සංකීර්ණය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, මධ්‍යම රියැදුරු පුහුණු පාසැල, කළමනාකරණ ආයතනය, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, වේරහැර සහ බොරලැල්ලේ අනෙකුත් අභ්‍යාස ආයතන) සාර්ථක වාණිජමය පදනමක් ඇතිව පවත්වාගෙන යා හැකි පරිදි ඒවායේ කටයුතු කරගෙන යෑමේදී සැළකිය යුතු ස්වාධීනත්වයක් සහ පරිපාලන වගකීමක්ද ලබාදෙන ලදී.

1987 වර්ෂයේදී ශ්‍රී. ලං. ග. ම. ක්‍රියාකාරිත්වයෙහි පසු බෑස්මක් ඇති විය. ධාවන කිලෝ මීටර් ප්‍රමාණය 1986 වර්ෂයේදී දශ ලක්ෂ 376.5 ක්ව තිබී 1987 වර්ෂයේදී දශ ලක්ෂ 370.9 දක්වා සියයට 1.5 කින් පහත වැටුණි. දිවයිනේ ඇතැම් ප්‍රදේශවල පැවති සිවිල් කලබල ධාවන කිලෝ මීටර් ප්‍රමාණය අඩුවීමට හේතු විය. මෙම බාධක උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නියමිත ධාවන කිලෝ මීටර් ප්‍රමාණය කෙරෙහි අයහපත් ලෙස බලපෑ අතර, ඇතැම් ප්‍රදේශවල පැවති කලබල හේතුකොටගෙන ධාවන රථ ඇණියට සැළකිය යුතු තරමේ අලාභහානි සිදුවිය. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල නියමිත ධාවන කිලෝ මීටර් ප්‍රමාණයෙන් ශ්‍රී. ලං. ග. ම. යට ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ පිළිවෙලින් සියයට 28 ක් හා සියයට 32 ක් පමණකි. පවත්නා රථ ඇණියෙන් සියයට 36 ක් පමණ ධාවනයට නුසුදුසු අබලන් තත්ත්වයක පැවැතීම ධාවන කිලෝ මීටර් ප්‍රමාණය කෙරෙහි අයහපත් ලෙස බලපෑවෙය.

වර්ෂය තුළ 7,250 ක් වූ බස් රථ ඇණියට අළුතෙන් එක්වූ බස් රථ නොමැති තරම්ය. මෙයිනුත් ධාවනය සඳහා සුදුසු වූයේ බස් රථ 4,750 ක් පමණි. කෙසේ වුවද, වර්ෂය තුළදී ශ්‍රී ලංගම විසින් බස් වැසි 171 ක් මිළදී ගැනීම සහ නිමි බස් රථ 155 ක් දැනටමත් ඇණවුම් කර තිබීම නිසා 1988 වර්ෂයේදී බස් රථ ඇණියේ මුළු සංඛ්‍යාව වැඩි වනු ඇත.

1987 වර්ෂයේ ප්‍රථම භාගයේදී ශ්‍රී. ලං. ග. ම.යේ ආදායම 1986 වර්ෂයේ එම කාල පරිච්ඡේදය තුළ ලබා ගත් ආදායමට වඩා සියයට 14 කින් වැඩි කර ගැනීමට හැකි විය. එහෙත් 1987 වර්ෂයේ ජූලි මාසයේදී කලබල ඇති වීමත් සමඟ වැඩ කටයුතු අඩාල වීම නිසා වර්ෂයේ ප්‍රථම භාගයේ ලබා ගත් ආදායම් ප්‍රමාණය එසේම පවත්වාගෙන යෑම දුෂ්කර විය. මෙකී දුෂ්කරතා මධ්‍යයේ වුවද, ශ්‍රී. ලං. ග. ම විසින් 1986 වර්ෂයේදී උපයන ලද රුපියල් දශ ලක්ෂ 2,332 ක ආදායමට වඩා 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 2,510 ක වැඩි ආදායමක් උපයන ලදී. මෙය සියයට 7.6 ක වැඩි වීමකි. මේ අතර උතුරු, නැගෙනහිර, උතුරුමැද සහ දකුණ ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩල වලින් සැළකිය යුතු පාඩු වාර්තා විය. පසුගිය වර්ෂවලදී මෙන්ම, මුළු මෙහෙයුම් පිරිවැය ප්‍රමාණයෙන් සියයට 12.3 කට සමාන වූ සහනාධාරයක් ශ්‍රී. ලං. ග. ම.ට මහ භාණ්ඩාගාරය වෙතින් ලැබිණි. මෙකී සහනාධාරය ලබා දෙන ලද්දේ පාසැල් ළමයින් සඳහා වූ සහනදායී වාර ප්‍රවේශ පත්‍ර, පොලිසියේ හා ආරක්ෂක සේවාවල නිලධාරීන්ට නිකුත්

කරන ලද නිදහස් ගමන් බලපත්‍ර සහ ආර්ථික අතින් පාඩු සහිත මාර්ගවල බස් රථ ධාවනයෙන් සිදු වූ පාඩු පියවීම සඳහාය. 1987 වර්ෂයේදී ලබා දෙන ලද සහනාධාරය රුපියල් දශ ලක්ෂ 287 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 152 ක් ආර්ථික අතින් පාඩු සහිත මාර්ගවල බස් රථ ධාවනය පවත්වාගෙන යෑම සඳහා ලබාදුනි.

### 1.21 සංඛ්‍යා සටහන

### ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ 1986 – 1987

| ශීර්ෂය | ඒකක | 1986* | 1985 ට වඩා ප්‍රතිශත වෙනස | 1987* | 1986 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. නව මෝටර් රථ ලියාපදිංචි කිරීම .. | සංඛ්‍යාව | | | | |
| 1·1 ශ්‍රී. ලං. ග. ම. බස් රථ .. | ,, | 254 | 167·4 | 51 | – 80·0 |
| 1·2 පෞද්ගලික බස් රථ .. | ,, | 1,781 | – 49·9 | 1,062 | – 40·4 |
| 1·3 පෞද්ගලික මෝටර් රථ .. | ,, | 7,297 | 20·1 | 7,590 | 4·0 |
| 1·4 ද්විත්ව කාර්ය වාහන .. | ,, | 3,892 | 247·1 | 3,234 | – 16·9 |
| 1·5 මෝටර් බයිසිකල් .. | ,, | 26,593 | 16·7 | 25,996 | – 2·2 |
| 1·6 ලොරි සහ අනෙකුත් බඩු ගෙනයන වාහන .. | ,, | 3,350 | – 53·6 | 2,917 | – 12·9 |
| 2. ශ්‍රී.ලං.ග.ම. ක්‍රියාකාරිත්වය | | | | | |
| 2·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 376·5 | – 3·5 | 370·9 | – 1·5 |
| 2·2 මගී කිලෝ මීටර් .. | ,, | 15,148·8 | 0·8 | 16,027·1 | 5·8 |
| 2·3 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 2,332·2 | 2·2 | 2,510·3 | 7·6 |
| 2·4 මුළු වියදම .. | ,, | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| 2·5 අතිරික්තය (+)/හිහය (–) .. | ,, | ලැ.නො | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| 3. ශ්‍රී ලංකා දුම්රිය සේවය | | | | | |
| 3·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 7·9 | – 7·1 | 8·1 | 2·5 |
| 3·2 මගී කිලෝ මීටර් .. | ,, | 1,972·0 | – 1·5 | 1,881·9 | – 4·6 |
| 3·3 භාණ්ඩ ටොන් කිලෝ මීටර් .. | ,, | 203·6 | – 12·2 | 198·4 | – 2·6 |
| 3·4 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 482·0 | 3·8 | 422·5 | – 12·3 |
| 3·5 මුළු වියදම .. | ,, | 771·2 | 45·5 | 823·6 | 6·8 |
| 3·6 අතිරික්තය (+)/හිහය (–) .. | ,, | – 289·2 | 342·2 | – 401·1 | 38·7 |

* තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය;
ශ්‍රී ලංකා දුම්රිය සේවය;
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

1987 වර්ෂයේදී පෞද්ගලික බස් රථවල මිළ ඉහළ යෑම සහ උතුරු, නැගෙනහිර සහ උතුරුමැද පළාත්වල ගමනා ගමන සේවා කපාහැරීමට සිදු වීම හේතුකොටගෙන පෞද්ගලික මගී ප්‍රවාහන සේවාවෙහි සහභාගිත්වය සැළකිය යුතු ලෙස පහත වැටුණි. එමෙන්ම, මිටි වහල හා අඩු ධාරිතාවය සහිත බස් රථ නාගරික ප්‍රදේශවල හා දුරස්ථ සේවා මාර්ගවල ධාවනය තහනම් කිරීම හේතුවෙන් මගී ප්‍රවාහනය වැඩි වැඩියෙන් රාජ්‍ය අංශය කෙරෙහි යොමු විය. නිරන්තර අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කටයුතු සඳහා බස් රථ ධාවනයෙන් ඉවත් කර ගැනීමට සිදු වීම, පෞද්ගලික අංශයේ බස් රථ සංඛ්‍යාව කෙරෙහි දැඩි ලෙස බලපාන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික බස් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් බස් රථ හිමියන්ට නිකුත් කළ බලපත්‍ර ප්‍රමාණය පසුගිය වර්ෂයේදී වූ 10,370 සිට මේ වර්ෂයේදී 9,170 දක්වා අඩු විය. එමෙන්ම, අළුත් බස් රථ සඳහා නිකුත් කළ මාර්ග බලපත්‍ර සංඛ්‍යාව 1985 වර්ෂයේදී වූ 4,128 ත්, 1986 වර්ෂයේදී වූ 3,205 ත් සමඟ සසඳනවිට 1987 වර්ෂයේදී 2,257 ක් දක්වා අඩු විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්තා මගින්ද ලියාපදිංචි කරන ලද පෞද්ගලික බස් රථ ප්‍රමාණයේ සැළකිය යුතු පහත වැටීමක් පෙන්වීය. එසේ ලියාපදිංචි කරන ලද බස් රථ සංඛ්‍යාව 1986 වර්ෂයේ වූ 1,781 සමග සසඳනකළ 1987 වර්ෂය සඳහා වූයේ 1,062 ක් පමණකි.

පෞද්ගලික මගී බස් රථ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් පෞද්ගලික අංශයට සහනදායී ණය පහසුකම් ලබා දෙමින් උස් වහළ සහිත බස් රථ ප්‍රමාණය වැඩි කිරීමට පියවර කිහිපයක් ගන්නා ලදී. මෙහි පළමු පියවර වශයෙන් ඉන්දියාවෙන් අළුත් බස් රථ 2,000 ක් ආනයනය කිරීමට පෞද්ගලික මගී බස් රථ ප්‍රවාහන අමාත්‍යාංශය මගින් කටයුතු පිළියෙල කර ඇති අතර ඒවා 1988 වර්ෂයේදී පෞද්ගලික අංශයට ලබා දෙනු ඇත.

පසුගිය වර්ෂවලදී මෙන්ම මෙම වර්ෂයේදීද, භාණ්ඩ ප්‍රවාහන සේවාවෙන් සියයට 80 කටත් වඩා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශය මගින් මෙහෙයවන ලදී. රට තුළ පැවැති අවිනිශ්චිත තත්ත්වය ගමනා ගමන කටයුතු කෙරෙහි අයහපත් ලෙස බලපෑමෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී. ලං. දු. සේ.) ඇතුළු රාජ්‍ය අංශයට රටේ සාමාන්‍ය භාණ්ඩ ප්‍රවාහනය පවත්වාගෙන යෑමට අපහසු විය. අළුතින් ලියාපදිංචි කරන ලද භාණ්ඩ ප්‍රවාහක වාහන සංඛ්‍යාව 1986 දී වූ 3,350 සිට 1987 දී 2,919 දක්වා සියයට 13 කින් අඩු විය.

1987 වර්ෂයේදී මෙරට පැවැති සිවිල් කලබල ශ්‍රී. ලං. දු. සේ. කටයුතුවලටද අයහපත් ලෙස බලපාන ලදී. අහිතකර තත්ත්වයන් පැවතුනද 1986 වර්ෂයේදී වූ දුම්රිය ධාවන කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 7.9 සිට 1987 වර්ෂයේදී දශ ලක්ෂ 8.1 ක් දක්වා සියයට 2.5 කින් වැඩි විය. 1986 දී දශ ලක්ෂ 1,972 ක්වූ මගී කිලෝ මීටර් ප්‍රමාණය සමඟ සසඳනවිට, 1987 වර්ෂයේදී එය දශ ලක්ෂ 1,882 ක් දක්වා සියයට 4.6 කින් පහත වැටුණි. පසුගිය වර්ෂය හා සසඳනවිට බඩු ටොන් කිලෝ මීටර් ප්‍රමාණයද සියයට 2.6 කින් පහත වැටුණි.

1987 වර්ෂයේදී බහළුම් පරිවහන සේවය සතුටුදායක ලෙස වර්ධනය විය. පෞද්ගලික අංශයේද සහභාගිත්වය ඇතිව බහළුම් පරිවහන සේවය පවත්වාගෙන යෑම සඳහා සීමිත වගකීම් සහිත සමාගමක් ආරම්භ කරන ලදී. රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතාවය ප්‍රමාණවත් අන්දමින් සපුරාලීමට ශ්‍රී. ලං. දු. සේවයට තවදුරටත් හැකි විය.

**නිවාස ඉදි කිරීම්**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1987 වර්ෂය, ජගත් නිවාස වර්ෂය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. නිවාස ඉදි කිරීම් ක්ෂේත්‍රය අත්පත් කරගත් ප්‍රධාන අරමුණු ලෙස මෙම වර්ෂය තුළ හඳුන්වා දෙනු ලැබූ (අ) ජාත්‍යන්තර නිවාස වර්ෂයේ ජාතික ක්‍රියාකාරී වැඩ සටහන සහ (ආ) ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල (ග්‍රා. නි. වැ) හා නාගරික නිවාස උප වැඩ පිළිවෙල (නා. නි. වැ.) සමඟ ප්‍රාථමික මට්ටමින් සැකසුරුවම් හා ණය දෙන සමුපකාර සමිති ඒකාබද්ධ කිරීම දැක්විය හැකිය. 1987 වර්ෂයේදී නිවාස දශ ලක්ෂයේ වැඩ සටහන යටතේ නිවාස ඉදි කිරීම්වල සැළකිය යුතු ප්‍රගතියක් ඇති විය. නිවාස ලක්ෂයේ වැඩ සටහන යටතේ ඉතිරිව තිබූ වැඩ කොටසද වර්ෂය තුළදී නිම කරන ලදී. 1984 වර්ෂයේදී ආරම්භ වූ නිවාස අවශ්‍යතා අනුව සකස් වූ පුළුල් වැඩ මාලාවක්ද ඇතුලත් වන පරිදි නිවාස දශ ලක්ෂයේ වැඩ පිළිවෙල මගින් රජයේ හා පෞද්ගලික යන දෙඅංශයෙහිම නිවාස තොගය (පහසුකම් ඇතුළත්) වැඩි කිරීමට බලාපොරොත්තු විය.

නිවාස දශ ලක්ෂයේ වැඩ පිළිවෙලෙහි අභිමතාර්ථය වන්නේ සැලසුම් ගත කාලය තුළදී (1984–1989) පවුල් විශාල ප්‍රමාණයකට (දශ ලක්ෂයක් හෝ ඊට වැඩි පවුල් සංඛ්‍යාවක්) නිවාස සැපයීමය. " රාජ්‍ය අංශයේ අවම මැදිහත්වීම සහ නිවාස පරිහරණය කරන්නන්ගේ උපරිම සහයෝගය " මෙහිලා භාවිතා කළ උපක්‍රමය විය. මෙම වැඩ සටහන යටතේ අළුතින් නිවාස ඉදි කිරීම, පවතින නිවාස වැඩි දියුණු කිරීම සහ නිවාස හා අදාළ වන වෙනත් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ද ණය සපයන ලදී. නිවාස දශ ලක්ෂයේ වැඩ පිළිවෙල යටතේ මෙම

වසර තුළදී දක්නට ලැබුන ප්‍රධාන කටයුත්ත වූයේ ජගත් නිවාස වසරේ ජාතික ක්‍රියාකාරී වැඩ සටහන ක්‍රියාත්මක කිරීම වූ අතර එමගින් දුප්පත් පවුල්වල අසතුටුදායක නිවාස තත්ත්වය දියුණු කිරීම අරමුණු කෙරිණි. පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව අමාත්‍යාංශ සාමාජිකයින් 21 දෙනෙකුගෙන් සමන්විත අන්තර් අමාත්‍යාංශ ක්‍රියාකාරී කමිටුව විසින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සහ විමර්ශනය කිරීම සිදු කරන ලදී.

විශේෂයෙන්ම අඩු ආදායම් මට්ටම් වෙත පැතිරෙන පරිදි පුද්ගලයන් හට දෙන නිවාස ණය ආපසු අයකර ගැනීම් සහතික කර ගැනීම වස් සැකසුරුවම් හා ණය දෙන සමුපකාර සමිතිවල සහභාගිත්වයෙන් ග්‍රාමීය නිවාස වැඩ පිළිවෙල හා නාගරික නිවාස වැඩ පිළිවෙල ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩ සටහන යටතේ 1987 වර්ෂය තුළදී, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පවුල් 14,269 ක් වෙත රුපියල් දශ ලක්ෂ 65 ක් ලබා දෙන ලදී.

ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල (ග්‍රා.නි.වැ.) නාගරික නිවාස උප වැඩ පිළිවෙල (නා.නි.වැ.) මහවැලි නිවාස උප වැඩ පිළිවෙල (ම.නි.වැ.), ප්‍රධාන ජනාවාස යෝජනා ක්‍රම නිවාස උප වැඩ පිළිවෙල (ප්‍ර. ජ. යෝ. නි. වැ.) හා පෞද්ගලික අංශයේ නිවාස උප වැඩ පිළිවෙල (පෞ. අං. නි. වැ.) නිවාස දශ ලක්ෂයේ වැඩ සටහනට අයත් උප වැඩ පිළිවෙලවල් විය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කෙරුණු ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල නිවාස දශ ලක්ෂයේ වැඩ පිළිවෙලට අයත් රාජ්‍ය අංශයේ ප්‍රධාන වැඩ පිළිවෙල විය. 1987 වර්ෂයේදී ණය පහසුකම් ලබා දීමේදී ඉලක්කය කරගත් පවුල් 36,700 ක් අතරින් පවුල් 36,502 ක්ම ඉන් ප්‍රයෝජන ලැබූහ. 1987 වර්ෂය තුළදී ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල යටතේ නිවාස ඉදි කිරීම් සඳහා ගෙවන ලද මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 194 ක් විය. 1986 දී මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 256 ක් විය. 1986 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව වූ 38,614 සමඟ සසඳන විට 1987 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව 42,423 ක් විය. මෙම වැඩිවීම සිදුවූයේ පෙර වර්ෂවලදී ආරම්භ කරන ලද නිවාස මෙම වර්ෂයේදී නිම කිරීම නිසාය. මේ අනුව, 1987 අවසානයට ඉලක්කය වූ නිවාස 173,219 ක් සමඟ සසඳා බලනවිට ඒකක 137,005 සම්පූර්ණ කර තිබුණි.

ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙලට වෙනස් ස්වරූපයක් ඇති නාගරික නිවාස උප වැඩ පිළිවෙල (i) නිවාස බිම් හා ඊට අදළ සේවා සැපයීම දියුණු කිරීම (ii) මුඩුක්කු හා පැල්පත් නඟා සිටුවීම යන අංශවලින් සමන්විත විය. මෙම වැඩ පිළිවෙල යටතේ මෙම වර්ෂයෙහි ඉලක්කය වූ පවුල් 10,828 න් පවුල් 7,291 කට ණය මුදල් ලබා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමයද ක්‍රියාත්මක කරන ලද්දේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසිනි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජ.න.ව.ස.ම.) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (ශ්‍රී. ලං. රා. වැ. සං.) විසින් වතු අංශයේ නිවාස උපයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. විමසුමට ලක්වන වර්ෂය තුළදී වතුවල සේවයකරන්නන් හා සමීපස්ථ ප්‍රදේශ තුළ වාසය කරනු ලබන ඉඩම් නොමැති ගැමියන් වෙත නිවාස පහසුකම් ලැබෙන පරිදි වතු අංශයේ නිවාස ප්‍රතිපත්තිය වෙනස්කරන ලදී. මේ අනුව, වතු අංශයේ නිවාස ප්‍රතිපත්තිය දිවයිනේ ජාතික නිවාස ප්‍රතිපත්තිය හා අනුකූල විය. තාවකාලික දත්තවලට අනුව 1987 වර්ෂය තුළදී යුගල නිවාස 835 ක් ජ.න.ව.ස.ම. විසින් සම්පූර්ණ කරන ලද අතර, ලයින් කාමර 1,486 ක් නඟා සිටුවන ලදී. ශ්‍රී. ලං. රා. වැ. සං. යටතේද මෙබඳුම නිවාස වැඩ සටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර, මෙමගින් යුගල නිවාස 171 ක්ද, නඟා සිටුවන ලද නිවාස ඒකක 1,315 ක්ද තනා අවසන් කරන ලදී.

## 1 . 22 සංඛ්‍යා සටහන

### නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙල යටතේ රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙලෙහි (අ) ක්‍රියාකාරිත්වය (1984 – 1987)

| ශිර්ෂය | | | නිවාස ඉලක්කය (පවුල් සංඛ්‍යාව) | ණය ලබා ගත් පවුල් සංඛ්‍යාව | | සම්පූර්ණ කළ නිවාස ඒකක/පොදු කාර්ය කටයුතු | | වියදම (රුපියල් දශ ලක්ෂ) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නිවාස ඉදි කිරීම් | පොදු කාර්ය කටයුතු | නිවාස ඉදි කිරීම් | පොදු කාර්ය කටයුතු (පවුල් සංඛ්‍යාව) | සැළසුම් කළ | නියම වශයෙන් වැය කළ |
| ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල | — | 1984 | 39,984 | 43,213 | — | 16,092 | — | 190·0 | 189·8 |
| | | 1985 | 40,679 | 42,077 | — | 39,876 | — | 225·3 | 218·7 |
| | | 1986 | 55,856 | 60,337 | — | 38,614 | — | 270·9 | 255·8 |
| | | 1987 | 36,700 | 36,502(ආ) | — | 42,423(ආ) | — | 215·0 | 194·5(ආ) |
| නාගරික නිවාස උප වැඩපිළිවෙල†† | — | 1985 | — | 7,584 | 14,788 | 2,314 | 14,788 | 150·3 | 104·3 |
| | | 1986 | 12,792 | 10,419 | 6,539 | 6,978 | 6,539 | 123·0 | 91·1 |
| | | 1987 | 10,828 | 7,291(ආ) | 7,013(ආ) | 7,778(ආ) | 7,013 (ආ) | 115·0 | 98·2(ආ) |

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

†† නාගරික නිවාස උප වැඩපිළිවෙල 1985 දී ආරම්භ කරන ලදී.

(අ) ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙලට සහ නාගරික නිවාස උප වැඩපිළිවෙලට අදාළ සංඛ්‍යා මෙයට අයත් වේ. කෙසේ වෙතත්, වතු අංශයේ නිවාස උප වැඩපිළිවෙල, මහවැලි නිවාස උප වැඩපිළිවෙල සහ ප්‍රධාන ජනාවාස නිවාස යෝජනා ක්‍රම උප වැඩපිළිවෙල වැනි අංශවලට අදළ සංඛ්‍යා මෙයට ඇතුළත් නොවේ.

(ආ) තාවකාලිකයි.

මහවැලි නිවාස උප වැඩ පිළිවෙල යටතේ ගල්නෑව, තඹුත්තේගම, නොච්චියාගම සහ බී, සී සහ ජී යන කලාප තුළ නිවාස 2,806 ක් ඉදි කරන ලදී. මේ අතර වැසිකිළි 5,911 ක් සහ ළිං 6,037 ක් තනා ගැනීම සඳහා ණය පහසුකම්ද සැළැස්විණි. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඉඟිනිමිටිය, මුතුකණ්ඩිය, කිරිදිඔය සහ වැළිඔය වැනි ජනාවාස යෝජනා ක්‍රමවල නිවාස ඉදි කිරීම සඳහා ආපසු අය කර ගැනීමේ පදනම මත ණය ලබාදීම තවදුරටත් සිදු කරන ලදී. ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රුපියල් 11,500 ක මුදලක් එක් පවුලක් වෙනුවෙන් ලබාදුනි. මෙම යෝජනා ක්‍රමය යටතේ අළුතින් නිවාස 137 ක් ඉදි කරනු ලැබීය.

තාවකාලික දත්තවලට අනුව, රාජ්‍ය අංශයේ නිවාස ඉදි කිරීම් සඳහා වැයවූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 424 ක් විය. මෙයින් රුපියල් දශ ලක්ෂ 293 ක්ම වැය කොට ඇත්තේ ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල සහ නාගරික නිවාස උප වැඩ පිළිවෙල වෙනුවෙනි.

කොළඹ මහ නගර සභාව විසින් 1987 දී නිවාස 596 ක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත. ඉකුත් වසරේදී අනුමත කරන ලද ප්‍රමාණය 410 ක් විය. අනුමත කරන ලද ගොඩනැගිලි වර්ග අනුව විස්තරයක්, සංසන්දනාත්මක පදනමක් මත 1.23 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**1 . 23 සංඛ්‍යා සටහන**

**කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් 1986 – 1987 ***

| ශීර්ෂය | | 1986 | 1985 ට වඩා ප්‍රතිශත වෙනස | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. නව නේවාසික නිවාස | .. | 410 | – 21·3 | 596 | 45·4 |
| 1·1 නිවාස | .. | 224 | – 32·5 | 246 | 9·8 |
| 1·2 තට්ටු නිවාස | .. | 186 | – 1·6 | 350 | 88·2 |
| 2. වාණිජ ගොඩනැගිලි | .. | 82 | 100·0 | 65 | – 20·7 |
| 3. කර්මාන්ත ගොඩනැගිලි | .. | 10 | 400·0 | 5 | – 50·0 |
| 4. පාසල් ගොඩනැගිලි | .. | 3 | 50·0 | 3 | – |
| 5. එකතු කිරීම් සහ වෙනස් කිරීම් | .. | 410 | 116·9 | 382 | – 6·8 |
| 6. වෙනත් ගොඩනැගිලි | .. | 99 | 67·8 | 70 | – 29·3 |
| මුළු ගණන | .. | 1,014 | 24·6 | 1,121 | 10·6 |

මූලය : කොළඹ මහ නගර සභාව.

* රජයේ සහ සංස්ථාවල ගොඩනැගිලි සැලසුම් ඇතුළත් නොවේ.

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, පුද්ගලයන් සහ නිවාස සංවර්ධනයේ නියැලෙන අය වෙත නිවාස ණය සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස තවදුරටත් පැවතුණි. 1987 වර්ෂයේදී මෙමගින් රුපියල් දශ ලක්ෂ 665 ක ණය මුදලක් නිවාස ඉදි කිරීම් සඳහා අනුමත කර ඇත. 1986 වර්ෂය තුළදී ලබා දුන් මුළු ණය මුදල රුපියල් දශ ලක්ෂ 629 ක් විය. 1987 වර්ෂයේදී නිවාස ඉදි කිරීම් කටයුතු සහ නිවාස මිළදී ගැනීම් වෙනුවෙන් දෙන ලද ණය සඳහා අය කළ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 8 සහ සියයට 20 අතර පැවතුණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව / විනාශයට පත් දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ ඒකාබද්ධ ණය යෝජනා ක්‍රමය යටතේ වර්ෂය තුළදී නිවාස පුනරුත්ථාපන කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 3 ක පමණ ණය මුදලක් සපයන ලදී.

1954 අංක 37 දරන ජාතික නිවාස පනත යටතේ පිහිටුවන ලද නිවාස සමිතියක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව ස්වකීය කටයුතු මෙම වර්ෂය තුළදී සීමිත පරිමාණයකින් තවදුරටත් කරගෙන යනු ලැබීය. 1986 දී ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 74 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 31 දක්වා පහත වැටුණි. ණය සම්බන්ධයෙන් අය කළ වාර්ෂික පොළී ප්‍රමාණය වාර්ෂිකව සියයට 9.5–22.0 සිට සියයට 11.5–22.0 දක්වා 1987 සැප්තැම්බර් මාසයේදී ඉහළ නංවන ලද අතර, වර්ෂය අවසානය දක්වා එම අනුපාතිකය නොවෙනස්ව පැවතුණි.

**නාගරික සංවර්ධනය**

1987 වර්ෂය තුළදී නාගරික සංවර්ධන කටයුතු මුදල් දුෂ්කරතා හේතුවෙන් පහත් මට්ටමක පැවතුණි. කෙසේ වෙතත් මීට පෙර ඇතිවූ ඇතැම් ව්‍යාපෘති මෙම වර්ෂය තුළදී නිම කිරීමට නාගරික සංවර්ධන අධිකාරියට හැකි විය. ඔරුගොඩවත්ත ආහාර ගබඩා සංකීර්ණයට යාබද ඉඩම් ගොඩ කිරීම, පැලියගොඩ ඉඩම් ප්‍රති සංවර්ධනය කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය, බම්බලපිටිය දුම්රියපොල පාරේ නිවාස සංකීර්ණය ආශ්‍රිතව ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලදී. මෙම වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන වශයෙන්ම නිරත වූයේ අළුත්කඩේ ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිලි සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතුවලය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ නගරයෙන් පිටත මෙහෙයවන ලද ව්‍යාපෘති අතර රත්නපුර සහ කල්මුනේ මහලේකම් කාර්යාලිය ගොඩනැගිලි සංකීර්ණය හා කතරගම නව නගර සංවර්ධන වැඩ පිළිවෙලද විය.

1987 වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය කළ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 370 ක් විය. ඉකුත් වර්ෂයේදී මේ සඳහා රුපියල් දශ ලක්ෂ 529 ක ප්‍රමාණයක් වැය කරන ලදී. මෙම වියදමෙන් ආසන්න වශයෙන් සියයට 70 (රුපියල් දශ ලක්ෂ 259) ක් අනුග්‍රාහකයන් වෙනුවෙන්වූ ව්‍යාපෘති සඳහා වැය කරන ලදී. ඉඩම් බැංකුව යටතේ පවත්නා ව්‍යාපෘති සඳහාද රුපියල් දශ ලක්ෂ 48 ක ප්‍රමාණයක් වැය කරනු ලැබීය.

අඩු ආදායම් සහිත නාගරික ජනයා සඳහා නිවාස ඉදි කිරීම පිණිස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රුපියල් දශ ලක්ෂ 98 ක් වැය කරන ලදී. 1986 වර්ෂයේදී මේ සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 91 ක් විය. නාගරික නිවාස උප වැඩ පිළිවෙල යටතේ 1987 වර්ෂයේදී නිවාස 7,778 ක් සම්පූර්ණ කරනු ලැබීය.

**මහා මාර්ග සහ දුම්රිය මාර්ග**

1987 දී දිවයිනේ ඇතැම් පළාත්වල පැවැති අභ්‍යන්තරික නොසන්සුන්තා මහා මාර්ග සහ දුම්රිය මාර්ගවලට අදාල වැඩ කටයුතු සඳහා අයහපත් ලෙස බලපාන ලදී. මෙම තත්ත්වයන් යටතේ වුවද, කිලෝ මීටර් 66 ක් පමණ වූ මාර්ග පද්ධතියක් පුළුල් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට හැකි විය. මේ අතර වර්ෂය තුළදී කිලෝ මීටර් 2,860 ක් පමණ වැලි හා බොරලු අතුරා සකස් කරන ලදී. ලෝක බැංකු ආධාර යටතේ 1987 වර්ෂයේදී පාලම් හතක ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදී. මේ අතර 1987 වර්ෂයේදී මහමාර්ග අමාත්‍යාංශය විසින් නඩත්තු කළ මාර්ග පද්ධතිය කිලෝ මීටර් 25,504 ක් වූ අතර 1986 වර්ෂයේදී නඩත්තු කරන ලද කිලෝ මීටර් ප්‍රමාණය 25,571 ක් විය.

වර්ෂය තුළදී මහාමාර්ග නඩත්තුව සඳහා රුපියල් දශ ලක්ෂ 254 ක් වැය කරන ලදී. මේ හැර මාර්ග ඉදි කිරීම සඳහා මෙම වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 384 ක් වැය කළ අතර 1986 වර්ෂයේදී මේ සඳහා වැය වූ මුදල රුපියල් දශ ලක්ෂ 214 ක් විය.

පෙර වසරවලදී මෙන්ම 1987 වර්ෂයේදීත් කිලෝ මීටර් 1,944 ක දුම්රිය මාර්ග පවත්වා ගෙන යන ලදී. කෙසේ වෙතත් වර්ෂය තුළදී සපුගස්කන්ද දුම්රිය මාර්ගය ගෝනවල දක්වා ඉදි කර අවසන් කෙරුණද ධාවනය සඳහා භාවිතය නොකෙරුණි. මරදන රාගම තුන්වැනි දුම්රිය මාර්ගයේ ඉදි කිරීම් කටයුතුවලද සැළකිය යුතු ප්‍රගතියක් මෙම වර්ෂය තුළදී දක්නට ලැබුණි.

**විදුලි සංදේශ සේවය**

1987 දී යාපනයේ හා ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් හුවමාරු මධ්‍යස්ථානවලට අලාභහානි සිදුවීමෙන් පසුව, උතුරු සහ නැගෙනහිර පලාත්වල විදුලි සංදේශ සේවාවලට අවහිරතා ඇති විය. වර්ෂයේ අගභාගයේදී දිවයිනේ වෙනත් පලාත්වල ඇතිවූ අභ්‍යන්තරික නොසන්සුන්තා හේතුකොට ගෙන, විදුලි පණිවුඩ සේවා පද්ධතියට අති විශාල අලාභ හානි සිදු විය. එම නිසා පවත්නා දුරකථන ධාරිතාවය පුළුල් කිරීමට, දියුණු කිරීමට සහ පවත්නා විදුලි සංදේශ පද්ධතිය නගා සිටුවීමට පමණක් නොව, පුනරුත්ථාපන වැඩ කටයුතු සඳහාද වැඩි ප්‍රාග්ධන වියදම් ප්‍රමාණයක් යෙදවීමට සිදු විය.

විදුලි සංදේශ ක්‍රමයේ හා අදළ මූලික සැළැසුමට අනුව, 1982 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘති කිහිපයක වැඩ කටයුතු අවසන් කිරීමත් සමඟ දිවයිනේ ප්‍රදේශ ගණනාවකටම අනුග්‍රාහක දුරස්ථ ඍජු ඇමතුම් පහසුකම් සපයන ලදී. ද්විතීයික දිස්ත්‍රික් හුවමාරු මධ්‍යස්ථාන-වලට සම්බන්ධිත, ඈත ප්‍රදේශ සඳහා අනුග්‍රාහක ඒකක 18 ක් අභිනවයෙන් සවි කිරීමත් සමඟම, දුෂ්කර ප්‍රදේශවලට ඍජු ඇමතුම් පහසුකම් සැළසෙන පරිදි දිස්ත්‍රික් හුවමාරු මධ්‍යස්ථානවල (අනුරාධපුරය, බණ්ඩාරවෙල, ගාල්ල, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, රත්නපුර) ධාරිතාවය පුළුල් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දිස්ත්‍රික් මධ්‍යස්ථානවලට අයත් මෙහෙයුම් ධාරිතාවය දුරකථන මාර්ග 1,662 කින් වැඩි විය. පානදුර පිහිටි අන්තර් හුවමාරු මධ්‍යස්ථානයට අයත් දුරකථන මාර්ග සංඛ්‍යාව 390 කින් වැඩි කරන ලදී. වර්ෂය තුළදී කුරුණෑගල සහ අනුරාධපුරයේ අංකිත හුවමාරු මධ්‍යස්ථානවල දුරකථන මාර්ග සංඛ්‍යාවද පිළිවෙලින් 62 කින් සහ 48 කින් වැඩි විය.

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල**

කඩිනම් මහවැලි වැඩපිළිවෙල ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. එනම් වික්ටෝරියා, කොත්මලේ, මාදුරුඔය හා රන්දෙනිගල යන ප්‍රධාන ජලාශ යෝජනා ක්‍රම; පහළ ඇළ වාරිමාර්ග හා ඉංජිනේරු කටයුතු සහ ජනාවාස ඇති කිරීම හා කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුයි. කඩිනම් මහවැලි වැඩපිළිවෙලෙහි වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල සහ මාදුරුඔය යන ප්‍රධාන ජලාශවල වැඩ කටයුතු දැනටමත් නිම කර ඇත. 'බී', 'සී' සහ 'ජී' යන කලාපයන්හි ගොවි පවුල් පදිංචි කිරීම හා වාරිමාර්ග පහසුකම් මෙන්ම පොදු කාර්ය පහසුකම් සැලසීම 1987 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණ. 1987 වර්ෂයේ අවසානය වන විට මෙම වැඩපිළිවෙල සඳහා දැරූ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 42,488 ක් විය. මෙයින් රුපියල් දශ ලක්ෂ 4,417 ක් හෙවත් සියයට 10 ක් 1987 දී වැය කරන ලදී.

1987 අවසානය වනවිට වික්ටෝරියා ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 9,044 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,050 ක් වසර තුළදී වැය කරන ලදී. ගිගවොට් පැය 457 ක බලශක්තියක් වසර තුළදී උත්පාදනය කර ඇත.

## 1 . 24 සංඛ්‍යා සටහන

### කඩිනම් මහවැලි වැඩපිළිවෙල – ගණන් බලන ලද වියදම

රුපියල් දශ ලක්ෂ

| යෝජනා ක්‍රමය | 1987 සඳහා වෙන් කළ වියදම | | | 1987 නියම වශයෙන්ම කළ වියදම (අ) | 1987 අවසන් වනවිට සමුච්චිත වියදම (අ) |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | පරිපූරක | එකතුව | | |
| 1. වික්ටෝරියා ජලාශය .. | 190 | 635 | 825 | 1,050 | 9,044 |
| 2. කොත්මලේ ජලාශය .. | 169 | — | 169 | 779 | 9,548 |
| 3. රන්දෙනිගල ජලාශය .. | 342 | 224 | 566 | 628 | 5,741 |
| 4. මාදුරුඔය ජලාශය සහ ඇල මාර්ගය .. | — | — | — | — | 2,645 |
| 5. මිනිපේ අන්තර් ද්‍රෝණි ඇල .. | 4 | — | 4 | 2 | 1,246 |
| 6. 'බී' වාරිමාර්ග කලාපය .. | 841 | — | 841 | 590 | 5,415 |
| 7. 'සී' වාරිමාර්ග කලාපය .. | 1,050 | 93 | 1,143 | 1,039 | 4,343 |
| 8. 'ජී' වාරිමාර්ග කලාපය .. | 92 | — | 92 | 82 | 394 |
| 9. I වන අදියර .. | — | — | — | — | 529 |
| 10. II වන අදියර .. | 33 | — | 33 | 71 | 2,387 |
| 11. නඩත්තු කිරීම .. | 288 | — | 288 | 321 | 674 |
| 12. අනෙකුත් .. | 344 | — | 344 | 176 | 1,196 |
| එකතුව .. | 3,353 (ආ) | 952 | 4,305 | 4,738 | 43,162 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

(ආ) අයවැය ප්‍රතිපාදනයෙන් සියයට එකොළහක් අඩු කිරීමෙන් පසුව.

1987 වසර අවසානය වන විට කොත්මලේ ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 9,548 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 779 ක් 1987 වසර තුළදී වැය කරන ලදී. උමඟ අලුත්වැඩියා කිරීම සඳහා වැය කරන ලද රුපියල් දශ ලක්ෂ 413 ක් ද මෙයට ඇතුළත් විය. එම වියදමින් රුපියල් දශ ලක්ෂ 373 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යකරණය කරන ලදී. කොත්මලේ අවට ප්‍රදේශය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ, කොත්මලේ සහ සංගිලිපාලම යන නව නගරවල පදිංචිකරුවන් සඳහා ආදයමක් උපයා ගතහැකි වැඩ පිළිවෙලවල්, නල මගින් ජල සම්පාදනය කිරීමේ යෝජනා ක්‍රම, සෞඛ්‍ය සහ අධ්‍යාපනික පහසුකම්, නව මාර්ග සහ අනෙකුත් පොදු කාර්ය පහසුකම් සැපයීම ආශ්‍රිත වැඩ කටයුතු 1987 වසර තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතිණ. වසර තුළ විදුලි බලය සැපයීමේ යෝජනා ක්‍රම 6 ක්, මාර්ග සහ ජල සම්පාදන යෝජනා ක්‍රම ගණනාවක් සම්පූර්ණ කරන ලදී.

1987 වසර අවසානය වනවිට රන්දෙනිගල ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 5,741 ක් විය. මෙම ව්‍යාපෘතිය මගින් 1987 වසර තුළ උත්පාදනය කළ බල ශක්ති ප්‍රමාණය ගිගවොට් පැය 200 කි. ව්‍යාපෘතිය අවට ප්‍රදේශ සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ, වසර තුළදී කීර්තිබණ්ඩාරපුර නව නගරයේ විදුලි බලය සැපයීමේ යෝජනා ක්‍රමය, මාර්ග වැඩි දියුණු කිරීම සහ ජනාවාස ඇති කිරීම සම්බන්ධ මූලික වැඩ කටයුතු කරගෙන යන ලදී.

වසර තුළ, පහළ ඇළ සංවර්ධන වැඩ කටයුතු සඳහා ද සැළකිය යුතු වියදමක් දරන ලදී. 'බී' සහ 'සී' කලාපයන්හි සංවර්ධනය සඳහා 1987 වසර තුළදී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 590 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,039 ක් වැය කෙරිණ. 1987 වර්ෂය අවසානය වනවිට මෙම කලාපයන් දෙක සඳහා වැය කරන ලද මුළු වියදම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,415 ක් සහ රුපියල් 4,343 ක් විය.

## 1 . 25 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | 1983/84 මහ | 1984 යල | 1984 එකතුව | 1984/85 මහ | 1985 යල | 1985 එකතුව | 1985/86 මහ | 1986 යල | 1986 එකතුව | 1986/87 මහ (අ) | 1987 යල (අ) | 1987 එකතුව(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **'එච්' කලාපය ..** | **23,620** | **19,990** | **43,610** | **23,309** | **18,319** | **41,628** | **24,298** | **21,225** | **45,523** | **24,965** | **13,058** | **38,023** |
| වී .. | 22,514 | 14,292 | 36,806 | 22,957 | 9,709 | 32,666 | 23,449 | 8,983 | 32,432 | 23,317 | 5,933 | 29,250 |
| අනෙකුත් භෝග .. | 1,106 | 5,698 | 6,804 | 352 | 8,610 | 8,962 | 849 | 12,242 | 13,091 | 1,648 | 7,125 | 8,773 |
| **'බී' කලාපය ..** | **1,749** | **1,438** | **3,187** | **2,535** | **2,246** | **4,781** | **3,851** | **3,554** | **7,405** | **5,961** | **5,805** | **11,766** |
| වී .. | 1,749 | 1,438 | 3,187 | 2,472 | 2,061 | 4,533 | 3,686 | 3,463 | 7,149 | 5,120 | 5,479 | 10,599 |
| අනෙකුත් භෝග .. | — | — | — | 63 | 185 | 248 | 165 | 91 | 256 | 841 | 326 | 1,167 |
| **'සී' කලාපය ..** | **7,140** | **3,609** | **10,749** | **7,545** | **4,857** | **12,402** | **9,358** | **7,868** | **17,226** | **10,139** | **9,588** | **19,727** |
| වී .. | 5,352 | 3,609 | 8,961 | 6,086 | 4,827 | 10,913 | 7,945 | 7,782 | 15,727 | 9,057 | 9,480 | 18,537 |
| අනෙකුත් භෝග .. | 1,788 | — | 1,788 | 1,459 | 30 | 1,489 | 1,413 | 86 | 1,499 | 1,082 | 108 | 1,190 |
| **'ජී' කලාපය ..** | **2,351** | **2,023** | **4,374** | **3,258** | **3,106** | **5,364** | **3,315** | **2,731** | **6,046** | **3,279** | **2,709** | **5,988** |
| වී .. | 1,975 | 1,405 | 3,380 | 2,941 | 1,198 | 4,139 | 3,153 | 1,423 | 4,576 | 3,220 | 1,176 | 4,396 |
| අනෙකුත් භෝග .. | 376 | 618 | 994 | 317 | 908 | 1,225 | 162 | 1,308 | 1,470 | 59 | 1,533 | 1,592 |
| **එකතුව ..** | **34,860** | **27,060** | **61,920** | **36,647** | **27,528** | **64,175** | **40,822** | **35,378** | **76,200** | **44,344** | **31,160** | **75,504** |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

වාරිමාර්ග සහ පොදු කාර්ය පහසුකම් සංවර්ධනය ඉහළ වර්ධන මට්ටමකට ලඟාවී ඇති ප්‍රදේශයන්හි ආයෝජන ක්‍රියාවලින් සංවර්ධනය කිරීම සඳහා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය තවදුරටත් අවධානය යොමු කරන ලදී. මහවැලි ප්‍රදේශයන්හි වෙළෙඳ ව්‍යාපාරයන් සඳහා ආයෝජන සේවාවන් ගණනාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 1987 වසරේදී, රැකියා, ආයෝජන සහ ව්‍යාපාර සංවර්ධන අංශය පිහිටුවිය. මෙම වැඩපිළිවෙල යටතේ මිශ්‍ර වගාවන්, පශු නිෂ්පාදන ගොවිපලවල්, කෘෂි ද්‍රව්‍ය සකස් කිරීම සහ බීජ නිෂ්පාදනය කිරීම ඇතුළත් ව්‍යාපෘතීන් 19 ක් 1987 දී අනුමත කරන ලදී.

තාවකාලික දත්තයනට අනුව, මහවැලි බල ප්‍රදේශයේ වගා කරන ලද බිම් ප්‍රමාණය 1986/87 මහ කන්නයේදී හෙක්ටයාර 44,344 ක් වූ අතර, එය පසුගිය වසරෙහි අදාළ කන්නයට වඩා සියයට 9 ක වැඩි වීමක් දැක්වීය. මෙම වැඩි වීමට විශාල වශයෙන් හේතු වූයේ 'බී' කලාපය යටතේ වගාකළ බිම් ප්‍රමාණය ඉහළ යෑමයි. එයට වෙනස්ව යමින්, 1987 යල කන්නයේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 12 කින් එසේ නැතහොත් හෙක්ටයාර 4,218 කින් අඩුවී හෙක්ටයාර 31,160 ක් විය. මෙයට හේතු වූයේ 'එච්' කලාපයේ වගා කරන ලද බිම් ප්‍රමාණය අඩු වීමයි.

1987 වගා වර්ෂය තුළ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 83 ක් වී වගාව සඳහා විය. මහ කන්නයේදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 92 ක් වී වගාව සඳහා යෙදවුනු අතර, යල කන්නයේදී වී වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 71 ක් විය. වගා වර්ෂය තුළදී 'බී' සහ 'සී' කලාපයන්හි වී වගාව යටතේ තිබුණ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 48 කින් සහ සියයට 18 කින් වැඩිවූ අතර, 'එච්' සහ 'ජී' කලාපයන්හි එය පිළිවෙලින් සියයට 10 කින් සහ සියයට 4 කින් අඩු විය.

1987 වගා වර්ෂය තුළදී මහවැලි ප්‍රදේශයන්හි මුළු වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 283,246 ක් වූ අතර, එය 1987 වසරේ රටේ මුළු වී නිෂ්පාදනයෙන් සියයට 13 ක් විය. 'එච්' ප්‍රදේශය පමණක් මහවැලි වැඩපිළිවෙල යටතේ නිෂ්පාදනය කළ මුළු වී නිෂ්පාදනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් නැතහොත් වී මෙට්‍රික් ටොන් 129,995 ක් නිපදවීය. මෙය 1986 දී එහි නිෂ්පාදනයට වඩා සියයට 13 කින් වැඩි විය. මුළු දිවයිනේම වී නිෂ්පාදනයෙන් 'එච්' ප්‍රදේශයේ නිෂ්පාදනයෙහි සාපේක්ෂ කොටස 1986 දී සියයට 4 සිට 1987 දී සියයට 6 දක්වා ඉහළ නැඟුණි.

1987 දී මහවැලි ප්‍රදේශයන්හි ධීවර කටයුතු ද ව්‍යාප්ත විය. 'එච්', 'සී' හා 'ජී' කලාපයන්හි මාළු පොකුණු 50 ක් පමණ දැනටමත් ඉදිකර ඇත. 'එච්', 'බී' හා 'සී' කලාපයන්ට මාළු සැපයීම සඳහා දඹුලු ඔය හා මාදුරුඔය ආශ්‍රිතව මාළු බෝකිරීමේ හා ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා තිබේ.

1987 වර්ෂය අවසානය වනවිට 'එච්' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 28,899 ක් විය. 1987 වසර අවසානය වනවිට 'සී' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 13,821 ක් කරමින් වසර තුළදී එම කලාපයේ පවුල් 1,407 ක් පදිංචි කරවන ලදී. වසර තුළදී 'බී' කලාපයේ පවුල් 793 ක් පදිංචි කරවන ලද අතර, එහි පදිංචි කළ මුළු පවුල් සංඛ්‍යාව 10,710 කට ලඟා විය. 1987 අවසානය වන විට 'ජී' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 3,604 ක් විය.

**වෙනත් වාරිමාර්ග සංවර්ධනය**

මහවැලි ව්‍යාපෘතීන්ට අමතරව කෘෂිකාර්මික සංවර්ධනයෙහිලා වාරිමාර්ග සංවර්ධනය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. නව වාරිමාර්ග ව්‍යාපෘතීන් ඉදි කිරීම, පවත්නා වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම හා ඒවායේ මනා පරිපාලනය සහ කුඩා පරිමාණ ජලාශ හා අමුණු පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය යන කටයුතු වාරිමාර්ග සංවර්ධනයට අයත් වේ.

කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ පළමුවන අදියරේ ඉදිකිරීම් වලින් සැළකිය යුතු කොටසක් 1987 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී. පහළ ඇල වාරිමාර්ග හා බෙද හැරීමේ පද්ධතියෙහි විශාල කොටසක් වර්ෂය තුළදී නිම කළ හෙයින් ලුණුගම් වෙහෙර ජලාශයෙන් දෙබරවැව, තිස්සවැව, පන්නෙගමුව, වීරවිල සහ යෝධකණ්ඩිය යන ප්‍රධාන ජලාශ 5 ට ජලය නිකුත් කිරීම ද සිදු විය. පළමුවන අදියර යටතේ අළුත් ඉඩම් හෙක්ටයාර 4,200 කට පමණ ද, දැනටමත් වගාකර ඇති ඉඩම් හෙක්ටයාර 4,600 කට පමණ ද වාරිමාර්ග පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. පළමුවන අදියර යටතේ පවුල් 3,780 ක් පමණ 1987 වර්ෂය අවසානය වනවිට පදිංචි කරවා ඇත. 1987 අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,598 ක් විය.

කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ දෙවන අදියර 1987 දී ආරම්භ විය. මෙයින් අළුත් ඉඩම් හෙක්ටයාර 4,100 කට වාරිමාර්ග පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. දෙවන අදියර සඳහා රුපියල් දශ ලක්ෂ 945 ක් වැය වේ යැයි තාවකාලිකව ගණන් බලා ඇත.

කලින් වගා කර ඇති බිම් ප්‍රමාණය වූ හෙක්ටයාර 2,575 ක් සහ අළුත් ඉඩම් හෙක්ටයාර 500 ක් ගංවතුරින් ආරක්ෂා කෙරෙන වේලි සහ පොම්පාගාරයක් ඉදි කිරීම අරමුණු කරගත් නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමයේ දෙවන අදියරෙහි කටයුතු 1987 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය සඳහා වර්ෂය තුළ වැය වූ මුදල රුපියල් දශ ලක්ෂ 585 ක් වූ අතර, වර්ෂය අවසානය වනවිට මෙම යෝජනා ක්‍රමය සඳහා දැරූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 839 ක් විය.

වර්ෂය තුළදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව ද කුඩා වාරිමාර්ග වැඩි දියුණු කිරීමේ කටයුතු නොකඩවා කරගෙන යන ලදී. ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ ආධාර ලබන ග්‍රාමීය වාරි-මාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ ගම්බද ප්‍රදේශවල ජලාශ සහ අමුණු 1,200 ක් පමණ නවීකරණය කිරීමට බලාපොරොත්තු වේ. 1987 වර්ෂය තුළ ව්‍යාපෘතීන් 227 ක වැඩ කටයුතු ආරම්භ කළ අතර, ව්‍යාපෘති 197 ක වැඩ කටයුතු අවසන් කරන ලදී. 1987 වර්ෂය අවසානයේදී මෙම යෝජනා ක්‍රම සඳහා වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 656 ක් විය.

**ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල**

සාපේක්ෂව නොදියුණු ග්‍රාමීය ප්‍රදේශවල ගැමි ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කරලීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල මගින් ග්‍රාමීය සංවර්ධනය සඳහා සම්පත් වෙන් කිරීමට ප්‍රමුඛතාවයක් දෙන ලදී. 1986 දී දිස්ත්‍රික්ක 13 ක මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වූ අතර, 1987 වර්ෂයේදී කළුතර සහ මහනුවර දිස්ත්‍රික්කයන්ට ද එය ව්‍යාප්ත කරන ලදී.

පින්ලන්ත රජයේ (ෆිනිඩා) ආධාර යටතේ කළුතර දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය 1987 ජූලි මාසයේදී ආරම්භ කරන ලදී. මෙම තුන් අවුරුදු වැඩපිළිවෙල සඳහා රුපියල් දශ ලක්ෂ 245 ක් වැය වේ යැයි ගණන් බලා ඇත. මෙයින් සියයට 85 ක් පමණ ෆිනිඩා ආයතනයෙන් අපේක්ෂා කෙරේ. මෙම වැඩපිළිවෙල මගින් ග්‍රාමීය පෙදෙස්වලට විදුලිය සැපයීම, සෞඛ්‍ය පහසුකම්, විදුලි සංදේශ පහසුකම්, ජලය සැපයීම සහ වන වගා කටයුතු සඳහා මූලිකත්වයක් දෙන ලදී. 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 7 ක් පමණ මේ සඳහා වැය කර ඇත. මහනුවර ඒකාබද්ධ ග්‍රාමීයසංවර්ධන වැඩපිළිවෙල ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව විසින් මූල්‍යකරණය කෙරේ. වැඩි පහසුකම් නොලත් ජන සමූහ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජනතාවගේ සමාජ, ආර්ථික තත්ත්වයන් දියුණු කරලීම මෙම යෝජනා ක්‍රමයේ අරමුණු වේ.

## 1 . 26 සංඛ්‍යා සටහන

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල – දිස්ත්‍රික්ක අනුව වියදම

## 1986 – 1987

රුපියල් දශ ලක්ෂ

| දිස්ත්‍රික්කය (අ) | විදේශීය ආධාර ලැබෙන මූලාශ්‍ර | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශ ආධාර ප්‍රමාණය | දේශීය | එකතුව | 1986 වර්ෂය අවසානය දක්වා | 1987 වර්ෂය අවසානය දක්වා (ආ) | 1986 වර්ෂය තුළදී | 1987 වර්ෂය තුළදී (ආ) |
| 1. කුරුණෑගල (1979) .. | ලෝක බැංකුව | 430 | 215 | 645 | 645 | 648 | 48 | 3 |
| 2. මාතර (1979) .. | සීඩා (ස්වීඩනය) | 383 | 42 | 425 | 119 | 153 | 25 | 34 |
| 3. හම්බන්තොට (1979) .. | නොරාඩ්(නෝර්වේ) | 686 | 14 | 700 | 310 | 382 | 54 | 72 |
| 4. නුවරඑළිය (1980) .. | නෙදර්ලන්තය | 449 | 56 | 505 | 186 | 228 | 48 | 42 |
| 5. මාතලේ (1981) .. | ලෝක බැංකුව | 305 | 143 | 448 | 231 | 274 | 39 | 43 |
| 6. පුත්තලම (1981) .. | ,, | 398 | 187 | 585 | 431 | 489 | 74 | 58 |
| 7. බදුල්ල (1982) .. | කෘෂි. සං. ජා. අරමුදල | 384 | 84 | 468 | 202 | 277 | 77 | 75 |
| 8. වවුනියාව (1984) .. | ලෝක බැංකුව | 246 | 133 | 379 | 63 | 63·6 | 8 | 0·6 |
| 9. මන්නාරම (1984) .. | ,, | 220 | 118 | 338 | 53 | 54 | 7 | 1 |
| 10. රත්නපුරය (1984) .. | නෙදර්ලන්තය | 366 | 9 | 375 | 52 | 81 | 30 | 29 |
| 11. මොණරාගල (1984) .. | නොරාඩ් (නෝර්වේ) | 392 | 8 | 400 | 48 | 103 | 19 | 55 |
| 12. මුලතිව් (1985) .. | නෙදර්ලන්තය | 353 | 7 | 360 | 5 | 6 | 1 | 1 |
| 13. කෑගල්ල (1986) .. | කෘෂි. සං. ජා. අරමුදල | 262 | 147 | 409 | 10 | 35 | 10 | 25 |
| 14. කළුතර (1987) .. | ෆිනිඩා (ෆින්ලන්තය) | 213 | 32 | 245 | 0·3 | 7·3 | 0·3 | 7 |
| 15. මහනුවර (1987) .. | ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව | 56 | 6 | 62 | 0·5 | 0·7 | 0·5 | 0·2 |

මූලය : සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂයන් වරහන් තුළ දක්වේ.
(ආ) තාවකාලික.

1986 දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල සඳහා වැය කරන ලද රුපියල් දශ ලක්ෂ 441 හා සසඳා බලන කල 1987 දී ඒ සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 446 ක් විය. 1987 වර්ෂය අවසානය වනතෙක් සෑම ව්‍යාපෘතියක් සඳහාම දරන ලද මුළු වියදම ද සමඟ 1986 සහ 1987 වර්ෂවල දැරූ වියදම් 1.26 සංඛ්‍යා සටහනින් දක්වේ.

සිවිල් කලබල නිසා මෙම වැඩපිළිවෙල තාවකාලිකව අත්හිටුවන ලද උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල හැරෙන්නට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලෙහි ක්‍රියාකාරිත්වය 1987 වර්ෂයේදී සතුටුදායක විය. ඒ හේතුව නිසාම කැනේඩියානු රජයේ ආධාර යටතේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ මඩකලපු දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය තවදුරටත් කල් දැමීමට සිදුවිය. ගම්පහ, ගාල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලෙහි ආරම්භක කටයුතු 1987 වර්ෂයේදී සිදු වෙමින් තිබුණි.